# සවියෙන් පෙරට අපි එකට

ඉ-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

බුද්ධාගම 1 වාරය

## පාඩම 6 - රාහුල පොඩි හාමුදුරුවෝ


සැකසුම

එස් .ජේ. මාධවී සුරංගිකා

බප/ හො/ගමිණි මධ්‍ය මහා විද්‍යාලය - ඉංගිරිය

# ආයුබෝවන්

## 6 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය

# නිපුණතාව

ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝගී කර ගනියි.

# නිපුණතා මට්ටම

තම ජීවිතය හැඩ ගසා ගැනීමට ශ්‍රාවක චරිත ආදර්ශයට ගනියි.

# රාහුල පොඩි හාමුදුරුවෝ



බෝසත් සිදුහත් කුමාරයාගෙයි
යසෝධරා දේවියගෙයි එකම
පුත්‍රයා තමයි රාහුල කුමාරයා
පුංචි කුමාරයා උපන් ඇසළ
පොහෝදිනයේම මහා
බෝසතාණන් අභිනිෂ්ක්‍රමණය
කරනවා
ඊට වසර ගණනාවකට පස්සේ
සුදොවුන් රජතුමාගේ
ආරාධනයෙන් භික්ෂූන් වහන්සේලා
පිරිවරාගෙන් බුදුරජාණන් වහන්සේ
කිඹුල්වත් පුරයට වඩිනවා
ඒ දර්ශනය දැකපු යසෝධරා
දේවිය සඳලුතලයේ ඉඳ රාහුල
කුමාරයාට බුදු හිමියන් හඳුන්වලා
දෙනවා ගාථා නවයකින්



ඒ තමයි **නරසීහ ගාථා**

නරසීහ ගාථා සජ්ජායනයෙන්
පස්සේ රාහුල කුමාරයාව පිටත්
කර යවනවා පියාගෙන් දායාද
ඉල්ලගන්න
අම්මාගේ වදන් අහපු රාහුල
කුමාරයා බුදුහිමි ඉදිරියට ගිහින්
මෙහෙම කිව්වා
" මහා ශ්‍රමණයන් වහන්ස ඔබ
වහන්සේගේ සෙවණැල්ලත්
මට සැපයි.
පිය කෙනෙකුගෙන් උරුම විය
යුතු දේ ලබා දෙනු මැන ”



- ඒ ඇසූ බුදුන් වහන්සේ " රාහුලය මම ඔබට මගෙන් ලැබිය යුතු උරුමය ලබා දෙමි" යි කියල නිග්‍රෝධාරාමයට එක්කගෙන ගිහින් සැරියුත් හාමුදුරුවන්ට භාර දුන්නා පැවිදි කරන්න



ඉතින් රජගෙදර හැමෝගේම ආදරය
සෙනෙහස මැද සුරතලයට හැදුණු වැඩුණු
මේ කුමාරයා රජ ගෙදර අයගේ වගේම
පැවිදි වුනාට පස්සේ  මහ සඟරුවනේද
සිත් දිනා ගත්තා
ඉතාම සංවර කීකරු හිමි නමක් වුණා
ගුරුවරු දෙන අවවාද  පිළි ගත්තා දවස
ගානේම අවවාද අනුශාසනා ලබා ගත්තා
කොයිතරම් කැමැත්තක් දැක් වුවා ද
කිව්වොත් දවස ගානෙම මළු මං පෙත්
ඇමදලා ඉවරවෙලා වැලි අහුරක් අරන්
උඩ දාලා
" මේ වැලි දෝතේ වැලිකැට ගානට මට
අද දවසේ අවවාද අනුශාසනා ලැබේවා "
කියලා ප්‍රාර්ථනා කරනවා



රාහුල හාමුදුරුවන්ගේ  විනීත බව ඇගයීමට ලක්වූ අවස්ථා බොහොමයි

ඒ වගේම පරීක්ෂාවට ලක් කළ අවස්ථාත් තියෙනවා

සමහර හිමිවරුන් රාහුල හාමුදුරුවෝ මළු මං පෙත් ඇමදලා නියමිත තැන කොහු තැබුවාට පස්සේ ආයෙත් කුණුරොඩු දාලා දොස් නගනවා

" පෙනේද රාහුල මිදුල ඇමද තිබෙන ආකාරය"

"පෙනේද රාහුල කොහු ඉදල් දමා තිබෙන හැටි " කියලා අනේ ඒත් රාහුල හාමුදුරුවෝ තරහා ගන්නේ නැ නැවතත් පිරිසිදු කරනවා



එක දවසක් සැරියුත් හාමුදුරුවෝත් එක්ක උන්වහන්සේගේ මව්තුමියගේ නිවසට රාහුල හිමියන් පිඬුසිඟා වැඩියා බෞද්ධ කාන්තාවක් නොවුණු ඒ මව්තුමිය මේ දෙදෙනාටම දොස් පවරමින් දන් බෙදුවා

ඒත් උන් වහන්සේලා කෝපයට පත් වුණේ නැහැ

ඉතින්

මේ පිළිවෙතට බුදු රජාණන් වහන්සේගේ ප්‍රශාංසාව හිමි වුණා



- දවසක් බුදු හාමුදුරුවෝ රජගහ නුවර රාහුල හිමි වැඩ විසූ අම්බලට්ඨිකාවට වැඩම කළා. රාහුල හිමියන් උන්වහන්සේට අසුන් පැනෙව්වා සිරිපා දෝවනය (සේදීම) කරාට පසු භාජනයක් තිබ්බා.



- එම පැන් බඳුන උපමා කරගෙන රාහුල හාමුදුරුවන්ට දහම් දෙසුවා.

දැන දැනම බොරු කීමට
ලජ්ජා නැති
තැනැත්තාගේ මහණකම
භාජනයක පතුලේ ඉතිරිව
තිබෙන ජලය ස්වල්පය
මෙන් හීන වූවකි



දැන දැනම බොරු
කීමට ලැජ්ජා
නැති
තැනැත්තාගේ
මහණකම
භාජනයෙන් ඉවත
දැමූ ස්වල්ප ජලය
මෙන් ඉවත
දැමූවකි.



දැන දැනම බොරු කීමට
ලජ්ජා නැති
තැනැත්තාගේ මහණකම
යටිකුරු කරන ලද
භාජනයක් මෙන් කිසි
ගුණ දහමක්
නොපිහිටවන්නකි.



දැන දැනම බොරු කීමට ලජ්ජා නැති තැනැත්තාගේ මහණකමට උඩුකුරු කරන ලද ජලය නැති භාජනය මෙන් හිස් වුවකි.



"මේ හින්දා විහිළුවටවත් බොරු කියන පුරුද්දක් ඇති කර ගන්න එපා" කියලා බුදුන් වහන්සේ අනුශාසනා කළා.

ඊට පස්සේ බුදු හාමුදුරුවෝ අහනවා " රාහුලයෙනි කැඩපතකින් ඇති ප්‍රයෝජනය මොකක්ද? කියලා " ස්වාමීණි එය අවශ්‍ය වන්නේ තමාට තමා පිළිබඳ විමසා බැලීම සඳහා කියලා රාහුල හිමියන් පිළිතුරු දෙනවා.

ඒ වගේම ඔබ සිතින් කයින් වචනයෙන් යමක් සිතන කොට කරනකොට සහ කියනකොට ඒ ගැන නැවත විමසා බැලිය යුතුය කියා අවවාද දෙනවා.



ඉතින් සියලු දෙනාගේ
අවවාද අනුශාසනා ගුණ
නුවණින් හා දැන උගත්මින්
වැඩුණු රාහුල හාමුදුරුවෝ
චුල්ලරාහුලෝවාද සූත්‍ර
දේශනාව අහලා සියලුම දුක්
නැති කරලා රහත්භාවයට
පත් වෙනවා
උන් වහන්සේ තුළ තිබුණු
සංවර බව නිසාම
ශික්ෂාකමී භික්ෂූන් අතර
අගතනතුරට ද
පත්වෙනවා

එහෙම නම් අප දැන් බලමු රාහුල හාමුදුරුවන්ගෙ චරිතයෙන් අපට ලබා ගන්න පුළුවන් ආදර්ශ මොනවාද? කියලා

- කීකරුකම
- අවවාද පිළිගැනීම
- ඇත්ත කථා කිරීම
- හරි වැරදි හඳුනා ගැනීමට හැකිවීම
- අනතිමානී බව

# අභ්‍යාස

01. රාහුල කුමරුගේ දෙමාපියන් කවුරුද?

02. රාහුල හිමියන් පැවිදි වූයේ කොහේද?

03. රාහුල හිමිගේ ගුරුවරයා කවුද?

04. රාහුල හිමියන් රහත්භාවයට පත් වූයේ කිනම් සූත්‍රය ඇසීමෙන්ද?

05. රාහුල හිමියන්ට ලැබුණ අග තනතුර කුමක්ද?

පිළිතුරු

1. සිදුහත් කුමරු සහ යසෝධරා දේවිය
2. කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයේ
3. සැරියුත් හාමුදුරුවෝ
4. චූල්ල රාහුලෝවාද සූත්‍රය
5. ශික්ෂාකාමී භික්ෂූන් අතර අග තනතුර

# නිමි